# පෙරවදන

සමාජ සුබසාධන අමාත්‍යාංශය ජාතික ප්‍රතිපත්තියක් නොමැතිව දශක දෙකක් තිස්සේ ආබාධිත බව පිළිබඳ ක්ෂේත්‍රයේ කටයුතු කර ඇත. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 1996 අංක 28 දරණ පණත සම්මත කරන ලදි. ආබාධිත බව පිළිබඳ කරුණු සම්බන්ධ වගකීම භාර ගැනීම සඳහා ගරු සමාජ සේවා අමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික මණ්ඩලයක් ස්ථාපිත කර ඇත.

ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව අවබෝධ කර ගැනීමෙන් අනතුරුව, ගරු සමාජ සුභසාධන අමාත්‍යවරයා විසින්, 2002 අගෝස්තු මාසයේ දී එවැනි ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදි. කමිටුවේ සභාපතිත්වය දරන ලද්දේ ආචාර්ය පද්මිණී මෙන්ඩිස් විසිනි.

කමිටුවේ ප්‍රයත්නය ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පතක ස්වරූපයෙන් ඔබ සමග බෙදා ගැනීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි. මෙම ලේඛනය ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ ආබාධිත බව හා සම්බන්ධ ක්ෂේත්‍රයේ කටයුතු කරන අන් සියලු දෙනාට විශාල වටිනාකමකින් යුත් එකක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් මෙම ලේඛනය කෙටුම්පතක් වශයෙන් මුද්‍රණය කරනු ලැබේ.

කෙටි කාලයක් තුල දී මෙම ප්‍රතිපත්ති ලේඛනය සැකසීම සඳහා කරන ලද දායකත්වය හා ගන්නා ලද මහන්සිය වෙනුවෙන් සමාජ සුභසාධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ ජනතාව සිය කෘතඥතාව කමිටුව වෙත පුද කරයි.

මේ රටේ ආබාධ සහිත ජනයාගේ තත්ත්වය යහපත් කරලීම කෙරෙහි මග පාදන ප්‍රතිපත්ති ලේඛනය සැකසීමෙහිලා දායක වූ අන් සියලු දෙනාට ද මගේ ස්තුතිය පුද කරමි.

වී ජෙගරාජසිංහම් මිය
ලේකම්
සමාජ සුභසාධන අමාත්‍යාංශය

2003 මැයි 02 දින

- ඉහත ඡේදයේ සඳහන් කර ඇති, දැනට පවත්නා පොදු ගොඩනැගිලි සහ වෙනත් ස්ථාන සම්බන්ධයෙන්, ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය විසින් නියම කරනු ලබන කාල සීමාවක් ඇතුලත දී ඉහළම ප්‍රමාණයේ ප්‍රවේශ පහසුකම් සලසනු ලැබේ.

- ළමුන්, තරුණ පුද්ගලයන් සහ වැඩිහිටියන් ඇතුලු වීමට කැමති පාසල් සහ අධ්‍යාපනික හා පුහුණු කිරීමේ ආයතනවලට භෞතික ප්‍රවේශ පහසුකම් ඇති කරනු ලැබේ.

- ආබාධ සහිත තැනැත්තන් රැකියා අපේක්ෂා කරන වැඩ ප්‍රදේශ සහ කාර්මික ගොඩනැගිලිවලට භෞතික ප්‍රවේශ පහසුකම් සලසනු ලැබේ.

- ඓතිහාසික ගුණය කෙරෙහි බලපෑමක් ඇති නොකරමින් ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි වෙනස්කම් ඇති කිරීම කළ නොහැකි වන ඓතිහාසික ගොඩනැගිලි සඳහා අභියෝගය වන්නේ, සංරක්ෂණ අවශ්‍යතාවන් සමග නොගැටෙන විකල්ප විසඳුම් හෝ වෙනත් නව ක්‍රම සොයා ගැනීමයි. කෙසේ වුව ද සියලු තත්ත්වයන් යටතේ ඓතිහාසික ගොඩනැගිලිවල ස්වභාවය සංරක්ෂණය කළ යුතුය. එම ස්වභාවයට, ද්‍රව්‍යවලට, ලක්ෂණවලට හෝ අවකාශයට බරපතල ලෙස හානිකර වන්නා වූ කිසියම් වෙනස් කිරීමක් සලකා බලනු නොලැබේ.

**(2)** ප්‍රවේශ පහසුකම් සහිත සංචාරක ව්‍යාපාරය: රටේ සංචාරය කිරීමට කැමති ආබාධ සහිත (දේශීය හෝ විදේශීය) පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සැලසීම වැඩි දියුණු කිරීමට පියවර ගනු ලැබේ

- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ප්‍රවේශ පහසුකම් සහිත හෝටල් ( සහ වෙනත් වර්ගයේ සංචාරක වාසස්ථාන) ඉදි කිරීම සඳහා අනුමැතිය දීමේ සිය මාර්ගෝපදේශවල අවශ්‍ය නිර්ණායක ඇතුලත් කරනු ලබන හෙයින්,

  - නව හෝටල් ඉදි කිරීමේ දී පොදු ප්‍රදේශවලට සහ උපයෝගිතාවලට ප්‍රවේශ පහසුකම් ඇතුලත් කරනු ලබන අතර, එය සියලු දෙනාට, විශේෂයෙන් රෝද පුටු භාවිත කරන්නන්ට, දෘශ්‍යාබාධිත අයට සහ ආබාධ සහිත වියපත් පුද්ගලයන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

  - ගොඩනැගීමට නියමිත නව හෝටල්වල ප්‍රවේශ පහසුකම් සහිත කාමර සහ යා කරන ලද නාන කාමර සාධාරණ සංඛ්‍යාවක් තිබෙනු ඇත. මෙය සියලු අමුත්තන්ගේ ප්‍රයෝජනයට හේතු වනු ඇත.

  - ගොඩනැගීමට නියමිත නව හෝටල්වල, විශේෂයෙන් සෝපාන සහ ඔසවනයන් වැනි පොදු උපයෝගිතා ස්ථානවල, සියලු දෙනාට අවබෝධ කර ගත හැකි යෝග්‍ය සංඥා ප්‍රදර්ශණය කරනු ලැබේ.

- යළි ඉදිකිරීම් සහ නැවත සකස් කිරීම් භාර ගැනීමේ දී, හෝටල්කරුවන් විසින්, සමාජ සුභසාධන අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකාව වෙනුවෙන් සකසන ලද ප්‍රවේශ පහසුකම් පිළිබඳ මාර්ගෝපදේශවල නියම කර ඇති පරිදි හැකි ප්‍රමාණයට ඉහත කොන්දේසි සැලකිල්ලට ගනු ඇත.

- ප්‍රවේශ පහසුකම් පිළිබඳ මාර්ගෝපදේශ පදනම් කර ගනිමින්, ප්‍රධාන සංචාරක භූමි සහ ආකර්ශනීය ස්ථානවලට හැකි පමණින් ප්‍රවේශ පහසුකම් සලසනු ලැබේ.

- ප්‍රවේශ පහසුකම් සහිත හෝටල් සහ සංචාරක ස්ථාන පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත්කොට, රට තුළ හා විදේශයන්හි පිහිටි හා සංචාරක නියෝජිත ආයතනවලට ලබා දෙනු ලබන අතර අන්තර් ජාලයෙහි පළ කරනු ලැබේ.

## 13 සන්නිවේදනයට සහ තොරතුරුවලට ප්‍රවේශය

බ්‍රේල් ක්‍රමය සහ සංඥා භාෂාව වැඩි වැඩියෙන් භාවිත කිරීම මගින්, දෘශ්‍යාබාධිත සහ ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන්ට වැඩි වැඩියෙන් ලේඛනවලට, සාහිත්‍යයට, ප්‍රවෘත්තිවලට හා තත්කාලීන සිදුවීම්වලට, සියලු සේවාවන්ට සහ මෙම කරුණු පිළිබඳ සාකච්ඡා හා විවාදවලට ප්‍රවේශ පහසුකම් ලැබෙනු ඇත. පෙනීම අහිමි වීම සහ ශ්‍රවණය අහිමි වීම වෙනුවෙන් හානිපූරණය කිරීම පිණිස ඔවුන් විසින් භාවිත කරනු ලබන සන්නිවේදන ක්‍රම මගින් ඔවුනට තොරතුරු ලබාගත හැකි වනු ඇත. පොදු ස්ථානවල ඇති යෝග්‍ය සංඥා භාවිතය නිසා ඔවුන් වඩා නිදහස් ලෙස ගමනෙහි යෙදෙනු ඇත. ශ්‍රවණාබාධිත පුද්ගලයන් අන්තර්කරණය කිරීම පහසු කිරීම සඳහා ඔවුන්ගේ “බිහිරි සංස්කෘතිය” සැලකිල්ලට ගනු ලබනු ඇත. විකල්ප සහ වර්ධනය වන සන්නිවේදන ක්‍රමවේදයන් අත්කර ගැනීම, වෙනත් සන්නිවේදන ක්‍රම නොමැති පුද්ගලයන් බලගන්වනු ලැබීමට හේතු වනු ඇත. ආබාධ සහිත තැනැත්තන්ට එමගින් පොදු සාකච්ඡාවල, සංවර්ධන වැඩසටහන්වල සහ සමාජයේ ප්‍රධාන ධාරාවේ සමාජීය, සිවිල්, දේශපාලනික සහ සංස්කෘතික කටයුතුවල සහභාගි වීමේ පුළුල් වරණයක් ලැබෙනු ඇත.

සන්නිවේදනයට සහ තොරතුරුවලට ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ගවලට පහත සඳහන් දෑ ඇතුළත් වනු ඇත.

- බරපතල ශ්‍රවණ අහිමිවීමක් ඇති පුද්ගලයන්ගේ භාෂාව ලෙස සංඥා භාෂාව පිළිගනු ලැබේ.

- ලියාපදිංචි සංඥා භාෂා පරිවර්ථකයන් අවශ්‍ය වන සියලු අවස්ථාවන්හි දී, රටේ සියලු ප්‍රදේශවලට, සහ සියලු අධ්‍යාපන සහ පුහුණු ආයතනවලට, එවැනි හැකි උපරිම සංඥා භාෂා පරිවර්ථකයන් සංඛ්‍යාවක් ප්‍රමාණවත් පුහුණුවක් සැපයීම මගින් ලබා ගත හැකි වනු පිණිස, ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

- දුම්රිය ස්ථාන, බස් නැවතුම්පලවල් සහ ගුවන් තොටුපළ වැනි පොදු ස්ථානවල හැකි සෑම ස්ථානයක ම ශබ්දය මත පදනම් වූ නිවේදන ක්‍රම පරිපූර්ණය කිරීම සඳහා ලිඛිත පාඨ සහ දෘශ්‍ය සංකේත භාවිත කරන අතර, එමගින් ශ්‍රවණාබාධිත අයට එය අවබෝධ කර ගත හැකි වනු ඇත.

- සාමාන්‍ය මහජනයා විසින් භාවිත කරනු ලබන පඩිකයන් මාරු වන ස්ථාන සහ ගොඩනැගිලි වැනි පොදු ස්ථානවල යෝග්‍ය සංඥා පුවරු සැලසුම්කොට සවි කරනු ලබන අතර එමගින් ඒවා සියලු දෙනාට, විශේෂයෙන් දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට

(ශබ්දය මත පදනම් වූ සංඥා) සහ ශ්‍රවණාබාධිත පුද්ගලයන්ට (පාඨ පදනම් කර ගත් සංඥා) භාවිත කළ හැකි වනු ඇත.

- බහුවිධ ආබාධිතබවින් සහ බුද්ධිමය ආබාධිතබවින් පෙළෙන පුද්ගලයන් වැනි කථාවෙන් සහ සංඥා භාෂාවෙන් සිය අදහස් ප්‍රකාශ කළ නොහැකි පුද්ගලයන් සඳහා, නව සහ යෝග්‍ය, විකල්ප සහ වර්ධනය වන සන්නිවේදන ක්‍රමවේදයන් දිරිමත් කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම කරනු ලැබේ.

- හැකි ප්‍රමාණයට සම්මන්ත්‍රණ සහ රැස්වීම් වැනි පොදු කාර්යයන්හි දී, සංවිධායකයන් විසින් සංඥා භාෂා භාවිත කරන්නන්ට සංඥා භාෂා පරිවර්ථකයන් ද, කථා කළ නොහැකි පුද්ගලයන් සඳහා යෝග්‍ය කථා පරිවර්ථකයන් හෝ විකල්ප හෝ වර්ධනය වන සන්නිවේදන ක්‍රම සහ, දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා අදාල ලේඛන බ්‍රේල් මාධ්‍යයෙන් ද සපයනු ඇත.

- සන්නිවේදනය සඳහා සංඥා භාෂාවක් භාවිත කරන පුද්ගලයෙකු අධිකරණය හමුවේ පෙනී සිටීම අවශ්‍ය වන කිසියම් කරුණක දී, ලියාපදිංචි සංඥා භාෂා පරිවර්ථකයෙකු අධිකරණ ක්‍රමය විසින් පිළිගැනීම, භාර ගැනීම හා ඇතුල් කර ගැනීම කරනු ඇත. එසේ ම කථාව මගින් හෝ සංඥා භාෂාව මගින් හෝ වෙනත් විකල්ප සහ වර්ධනය වෙමින් පවත්නා සන්නිවේදන ක්‍රම මගින් සිය අදහස් ප්‍රකාශ කළ නොහැකි තැනැත්තන් සඳහා පවුලේ සාමාජිකයන් ඇතුලු යෝග්‍ය පරිවර්තකයන් සපයනු ලැබේ.

## 14 ආධාරක උපකරණ සහ තොරතුරු තාක්ෂණය

ආබාධ සහිත තැනැත්තන්ට වඩාත් ස්වාධීන වීමට සහ ඔවුන් සමාජයේ ඇතුලත් වීම ප්‍රවර්ධනය කිරීමට හැකියාව ලබා දෙන, විවිධාකාරයේ ආම්පන්න සහ උපකරණ, ආධාරක සහ අනුවර්තක උපකරණවලට ඇතුලත් වේ. ඉතා බහුල වශයෙන් යොදා ගන්නා ආම්පන්න සහ උපකරණ වන්නේ ත්‍රිරෝද බයිසිකල්, රෝද පුටු, කෘත්‍රිම අවයව, කිහිලිකරු, ශ්‍රවණාධාර, සුදු සැරයටි සහ කණ්නාඩි වේ. කැතීටර, මුත්‍රා බෑග සහ මළපහ බෑග වැනි වෙනත් වෛද්‍යමය උපකරණ, ආබාධ සහිත බොහෝ පුද්ගලයන්ගේ දෛනික ජීවිතය සඳහා අත්‍යවශ්‍ය වේ.

ආබාධ සහිත තැනැත්තන්ට සමාජයේ ක්‍රියාකාරි සාමාජිකයන් වශයෙන් කටයුතු කිරීම සඳහා උපකාරි වන එම උපකරණ, පහත සඳහන් උපාය මාර්ග මාර්ගයෙන් නිදහසේ ලබා ගත හැකි, යෝග්‍ය පරිදි සකස් කර ඇති සහ ලබා ගැනීමට පහසු උපකරණ බවට පත් කරනු ලැබේ.

- යෝග්‍ය උපකරණ නිෂ්පාදනය, ලබාගත හැකි වීම හා බෙදා හැරීම සහ ඒවා පිළිබඳ අවශ්‍යතා තක්සේරුව, පුහුණුව, පසු විපරම, අලුත් වැඩියා කිරීම හා නඩත්තුව සහ තොරතුරු බෙදා හැරීම සඳහා අවශ්‍ය සේවාවන් වැඩි කිරීම.

- ආධාරක සහ අනුවර්තක උපකරණ සැපයීමේ දී අදාල පුද්ගලයාට සහ ඔහුගේ/ඇයගේ ජීවන රටාවට හා ඔහු ඇය ජීවත් වන තත්ත්වයට ඒවායේ යෝග්‍ය භාවය සලකා බැලෙනු ඇත. තත්ත්ව සහතික සඳහා නියෝග සහ පරිපාටි මගින් මෙය සහතික කරනු ලැබේ.

- ආධාරක උපකරණ දේශීය වශයෙන් සොයා ගැනීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම දිරිමත් කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම කරනු ලැබේ.

- ආධාරක සහ අනුවර්තක උපකරණවල පිරිවැය අවම කිරීම සඳහා සහ ඒවා දැරිය හැකි මිලකට ලබා දීම සඳහා පියවර ගනු ලැබේ. අඩු කළ රේගු ගාස්තු හා බදු වැනි ක්‍රියාමාර්ග සලකා බලනු ලැබේ.

- ආබාධ සහිත තැනැත්තන්ට අවශ්‍ය ආධාරක සහ අනුවර්තක උපකරණ පිළිබඳ දත්ත කලින් කලට එකතු කරන අතර, එමගින් මෙම ක්ෂේත්‍රයේ අවශ්‍යතා තක්සේරු කිරීම සහ ඒවා සපුරාලීම සඳහා සම්බන්ධීකරණ පියවර ගැනීම කළ හැකි වනු ඇත.

**(2)** තොරතුරු තාක්ෂණයේ සීඝ්‍ර දියුණුව, ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක බව දියුණු කිරීමේ ඉඩප්‍රස්ථා වැඩි කිරීමට හේතු වී ඇත. තොරතුරු තාක්ෂණය වඩාත් ප්‍රවේශ පහසුකම් සහිත හා දැරිය හැකි බවට පත් කිරීම මගින් මෙම දියුණුවේ ප්‍රතිලාභ ඔවුනට ලබා දිය හැකි වනු ඇත.

මේවාට පහත සඳහන් දෑ අයත් වේ.

- ප්‍රවෘත්තිවලට සහ සන්නිවේදනය සඳහා ප්‍රවේශය ලැබීම පිණිස අන්තර් ජාලය භාවිත කිරීම.

- දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා කථන සංශ්ලේෂක සහ ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන් සඳහා අනුවර්තක දුරකථන සහිත පෞද්ගලික පරිගණක වැනි පහසු හා වඩාත් ඵලදායී සන්නිවේදන ක්‍රම.

**(3)** තොරතුරු තාක්ෂණය විශාල පරාසයක රැකියා ඉඩප්‍රස්ථා ද විවෘත කරන අතර විවෘත රැකියාවන්හි ආබාධ සහිත තැනැත්තන් සඳහා ඉඩප්‍රස්ථා වැඩි කිරීම පිණිස මෙය යොදා ගනු ලැබේ. සිය ආබාධිතබව නිසා නිවසේ සිට වැඩ කිරීම පහසු වන පුද්ගලයන්ට කොන්ත්‍රාත් වැඩ සහ වෙනත් ක්‍රම සඳහා ඉඩප්‍රස්ථා ඇති කිරීම පිණිස පහසුකම් සලසනු ලැබේ.

## <u>15 ළමුන්</u>

සියලු ආකාරයේ වෙනස්කම් කිරීමට හා විශේෂයන්ට එරෙහිව ළමයා ආරක්ෂා කරන බවට ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වන එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 2 වන ව්‍යවස්ථාව ප්‍රකාශ කරයි. "ප්‍රඥප්තියෙහි ප්‍රකාශ කර ඇති සියලු අයිතිවාසිකම් බෙදිය නොහැකි සහ එකිනෙකට සම්බන්ධ වන ඒවා වන අතර, එම සැම සහ සියලු අයිතිවාසිකම් ළමයාගේ ගරුත්වයට නෛසර්ගික ඒවා වේ" යනුවෙන් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ප්‍රකාශ කරයි. (එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල 1999). මෙම ප්‍රකාශ ආබාධිතබව පිළිබඳ මෙම ප්‍රතිපත්තිය මගින් යළි තහවුරු කරන අතර එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි ලංකාව විසින් එකග වී ඇති සියලු අයිතිවාසිකම්වලට ආබාධ සහිත ළමයාට තිබෙන අයිතිය ආරක්ෂා කරනු ඇත.

(විශේෂයෙන් ම කොන් කරනු ලැබූ කණ්ඩායමක් වන) ආබාධ සහිත ළමුන්ට, ජීවත් වීම සහ දිවි පැවැත්ම ආරක්ෂාව සහ හැකි උපරිම ප්‍රමාණයට සංවර්ධනය සඳහා නෛසර්ගික අයිතියක් තිබෙන බව, (එ ජා ළමා ප්‍රඥප්තියේ 6 වන ව්‍යවස්ථාව) ආබාධිතබව පිළිබඳ මෙම ප්‍රතිපත්තිය මගින් විශේෂයෙන් අවධාරණය කරයි.

මෙම ප්‍රතිපත්තිය මගින් එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියේ ප්‍රකාශ දෙකක් අවධාරණය කරයි. පළමුවැන්න වන්නේ, "ළමයින් පිළිබඳ සියලු ක්‍රියාකාරකම්වල දී ළමයාගේ වැඩි ම යහපත මූලිකව සැලකිය යුතු කරුණක් විය යුතුය" යන මූලධර්මයයි. (3 වන ව්‍යවස්ථාව) දෙවැන්න වන්නේ, "ළමයාගේ ශක්නුතාවන් වර්ධනය වන ආකාරයට යෝග්‍ය වන මග පෙන්වීම් කිරීමට දෙමව්පියන්ට සහ ව්‍යාප්ත පවුලේ අයිතිවාසිකම් සහ වගකීම්වලට රජය ගරු කළ යුතු ය" යන සංකල්පයයි. ( 5 වන ව්‍යවස්ථාව)

මෙම සන්දර්භය තුළ, පහත සඳහන් උපාය මාර්ග මගින්, ආබාධ සහිත ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම කරනු ඇත.

(1) ආබාධ සහිත ළමයාට උපකාර කිරීම.

- පවුලේ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි සහභාගි වීම ඇතුළුව පවුල් ජීවිතයේ සහභාගිවීමේ දී සහ අන්තර් ක්‍රියාවන්හි දී සාධාරණත්වය ඇති කිරීම

- සතුට, ආදරය සහ අවබෝධය සහිත පරිසරයක් තුළ ගරුත්වය සහතික කරන සහ ආත්ම ශක්තිය ප්‍රවර්ධනය කරන තත්වයන් යටතේ පරිපූර්ණ සහ යහපත් ජීවිතයක් ගත කිරීම.

- සිය සමවයස් කාණ්ඩ සමග එක්ව ප්‍රජා ජීවිතයෙහි ක්‍රියාශීලී ලෙස සහභාගි වීම.

- එක් එක් ළමයාගේ වඩාත් සාමාන්‍ය, සාකල්‍ය සහ හැකි සම්පූර්ණ පුද්ගල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තිවසින් ආරම්භ වන ඉක්මන් උත්තේජන සහ සංවර්ධන වැඩසටහන්.

- කිසියම් අසනීපයක් හෝ ආබාධිතබවක් කලින් හඳුනා ගැනීම, මේවාට සම්බන්ධ අනතුරුදායක සාධක සහ ඒවා මැඩපැවැත්වීම සඳහා හදිසි සහ ඵලදායී ප්‍රතිකාර සහ සැලකිල්ල.

(2) දෙමාපියන්ට සහ වෙනත් පවුලේ සාමාජිකයන්ට උපකාර කිරීම.

- ආබාධ සහිත එක් එක් ළමයාට උපකාර කිරීම සඳහා අවශ්‍ය ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි පිළිගෙන ඇති අයිතිවාසිකම් පිළිබඳ දැනුම, නිපුණතා, උපදෙස් හා උපදේශන, සිය වගකීම් ඉටු කිරීමට ඔවුනට හැකි වනු පිණිස දෙමාපියන්ට සහ අනෙකුත් පවුලේ සාමාජිකයන්ට ලබා දෙනු ඇත.

(3) පහත සඳහන් කරුණු ප්‍රවර්ධනය කරන්නා වූ පවුල් සෞඛ්‍යය

- හැකි ඉහළම ගුණාත්මක බවින් යුත්,
- ප්‍රසූතියට පෙර, ප්‍රසූතියේ දී සහ ප්‍රසූතියට පසු සැලකිල්ල

- ළදරුවාගේ සතුටුදායක වැඩීම සහ වර්ධනය සහතික කරලීම සඳහා වැඩීම නියාමනය කිරීම ඇතුලුව ළදරු සහ ළමා ආරක්ෂණය

- ප්‍රතිශක්තිකරණ වැඩසටහන්, පවුල් සැලසුම් කිරීම, පෝෂණ වැඩසටහන්, පාචන රෝග හා දරුණු ශ්වසන ආසාදන පාලනය කිරීම, පාසල් සෞඛ්‍ය වැඩකටයුතු සහ පාසල් ළමුන් රැකවරණය, වසංගත රෝග පරීක්ෂාව, ජාන උපදේශනය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ (තයිරොයිඩ් ඌණතාව වැනි) සමහර රෝග පිළිබඳ අවදානම සොයා ගැනීම සඳහා ළදරු වියේ දී විශේෂිත පරීක්ෂණ කිරීම මගින් ආබාධිතබව වැළැක්වීම.

- යෞවන ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන්

(4) මුල් ළමාවියේ රැකවරණ සහ සංවර්ධන වැඩසටහන්, පෙර පාසල් සහ බාලාංශ.

- ආබාධ සහිත ළමුන් මුල් ළමාවියේ රැකවරණ සහ සංවර්ධන වැඩසටහන්වල සහ ආයතනවල ඇතුලත් කිරීම පිණිස සහ, ආබාධ සහිත ළමුන්ගේ උපරිම සහභාගිත්වය සහ සංවර්ධනය සහතික කරලීම සඳහා, මුල් ළමාවියේ රැකවරණ සහ සංවර්ධන වැඩසටහන්වල, පෙර පාසල් සහ බාලාංශවල ගුරුවරුන්, උපදේශකයන් සහ වෙනත් වර්ගයේ සේවකයන්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබා දෙනු ඇත.

(5) පාසල් අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය

- ඉහත (4,5,6) ක්ෂේත්‍රයන්හි අදාළ ප්‍රතිපත්තිය බලන්න

## 16 තරුණ පුද්ගලයන්

ආබාධ සහිත තරුණ පුද්ගලයන්, සිය සමවයස් කාණ්ඩවල තරුණ පුද්ගලයන් සමග රටේ තරුණ පුද්ගලයන් සඳහා සැලසුම් කරන ලද සියලු ක්‍රියාකාරකම්වල සහභාගී වනු ඇත. තම සම වයස් කාණ්ඩ පුද්ගලයන් මෙන් සිය හැකියාවන් නිපුණතා වර්ධනය කර ගැනීම සඳහා සහ, ගරුත්වය සහ වටිනාකමක් පිළිබඳ හැගීමක් ඇති, විනය ගරුක, වගකීම් දරන සහ ප්‍රතිචාර දක්වන්නා වූ, වැඩිහිටියන් බවට පත්වීම සඳහා, ඔවුනට සම ඉඩප්‍රස්ථා ලැබෙනු ඇත.

තරුණ සංවර්ධනය සඳහා සැලසුම් කරන ලද පහත සඳහන් උපාය මාර්ග අනුගමනය කිරීම මගින් මෙය ප්‍රවර්ධනය කරනු ලැබේ.

- නිපුණතා සංවර්ධනය සහ තාක්ෂණික සහ වෘත්තීය පුහුණුව
- වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය
- ව්‍යාපාර සංවර්ධනය
- සුලු පරිමාණ ණය යෝජනා ක්‍රම සහ සමූපකාර සමිති
- රැකිරක්ෂා සහ ආදායම් ඉපයීම
- මානව සම්පත් සංවර්ධනය
- තොරතුරු බෙදාහැරීම
- තරුණ සමාජ සහ සංගම්

- නිදසුනක් වශයෙන් තරුණ සේවා කාර්ය බලකාය මගින් තරුණ සංවර්ධනය
- සංස්කෘතික වැඩසටහන්
- ක්‍රීඩා සහ විනෝද

ආබාධ සහිත තරුණ පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතා පහත සඳහන් කටයුතුවල දී සැලකිල්ලට ගනු ලැබේ.

- තරුණ ප්‍රතිපත්තිය වර්ධනය කිරීම සහ සංශෝධනය කිරීම
- තාරුණ්‍යය සම්බන්ධ පර්යේෂණ
- තරුණ කටයුතු සඳහා සේවකයන් පුහුණු කිරීම
- තරුණ වැඩසටහන් සැලසුම් කිරීම සහ ඇගැයීම

ආබාධ සහිත තරුණ පුද්ගලයන් තරුණ සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවල ඇතුලත් කිරීම, ආබාධ සහිත සහ ආබාධ රහිත යන කණ්ඩායම් දෙකමට අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙයි. සහෝදර පුරවැසියන් අතර වෙනස්කම් පිළිගන්නා සහ ගරුකරන සමාජයක් මෙමගින් නිර්මාණය වන අතර සාමකාමී සමපැවැත්ම ශක්තිමත් කරනු ඇත.

## 17 කාන්තාවෝ

(1) සාධාරණත්ව පදනම මත ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ තත්ත්වය නැංවීම සඳහා, ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ අනාගත සැලසුම්වල, ආබාධ සහිත කාන්තාවන් ඇතුලත් කරනු ලැබේ.

ඔවුන් විශේෂයෙන් ම පහත සඳහන් දෑ වල ඇතුලත් කරනු ඇත.

- විශේෂයෙන් ම ආබාධ සහිත මව්වරුන් ඇතුලු අවදානමට යටත් කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කරන ලද, දිළිඳුකම දුරලීමේ සහ සමාජ ආරක්ෂණ වැඩසටහන්.

- රැකියාව සඳහා කාන්තාව සතු අයිතිය, රැකියාවේ ගුණාත්මක බව, ආර්ථික අභිවර්ධනය සඳහා සමාන අයිතිය, සේවා ස්ථානවල ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී පරිසරයක් ප්‍රවර්ධනය කිරීම වැඩි කරන සහ සේවකයන් ලිංගික හිරිහැර සහ සූරාකෑමට ලක් කිරීම අහෝසි කරන වැඩසටහන්

- ශ්‍රම වෙළඳ පලේ ඉල්ලුම් කරන නිපුණතාවන්ට ගැලපෙන නිපුණතා සංවර්ධන සහ තාක්ෂණික හා වෘත්තීය පුහුණු කිරීමේ වැඩසටහන්.

- අවුරුදු 5 - 14 වයස් කණ්ඩායම්වල අධ්‍යාපනය සර්වව්‍යාප්තිකරණය සහ කාන්තාවන්ගේ පෞද්ගලික සංවර්ධනය සඳහා පාසල්, නොවිධිමත් සහ උසස් අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම.

- නිවසේ, ප්‍රජාව තුල සහ සමාජයේ කාන්තාවන්ට එරෙහි හිංසාව, ලිංගික හිරිහැරය සහ ලිංගික සූරාකෑම අහෝසි කිරීම සහ පීඩාවට පත් වූවන් සඳහා උපකාරක සේවා.

- පවුල් සැලසුම් සහ සෞඛ්‍යමය ජීවන රටාවකට ප්‍රවේශය වැඩි කරන වැඩසටහන්.

- සමාජ සංවිධානයේ සහ සිවිල් පරිපාලනයේ හා දේශපාලන ක්‍රියාවලියේ සියලුම මට්ටම්වල තීරණ ගැනීමේ ක්‍රියාවලිය ඇතුළු පවුල, ආර්ථිකය සහ සමාජය තුළ සමාන සහභාගිත්වය සහ හවුලේ භුක්ති විඳීම සඳහා ස්ත්‍රී පුරුෂයන් අතර සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම.

- සාමය, සහයෝගිතාව සහ ජාතිය යළි ඉදි කිරීම කෙරෙහි යොමු වූ වැඩසටහන්.

- කාන්තාවන් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලසුම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම සහ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගෙ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම (CEDAW) නියාමනය කිරීම.

## 18 වියපත් පුද්ගලයන්

වියපත් පුද්ගලයන් සඳහා ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට කරනු ලබන අනාගත සමාලෝචන හා සංශෝධන තුළ ආබාධ සහිත වියපත් පුද්ගලයන් සඳහා විශේෂ ප්‍රතිපාදන සලසනු ඇත. වෙනත් වියපත් පුද්ගලයන් සම්බන්ධයෙන් මෙන්, ආබාධ සහිත වියපත් පුද්ගලයන්ට ගෞරවයෙන් සලකනු ලබන අතර, ඔවුනට ආරක්ෂාව පිළිබඳ හැඟීමක් ඇතිව සහ හැකි තරම් ප්‍රමාණයට ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් වයසින් වැඩීමට හැකි වනු ඇත. ඔවුනට හැකි තරම් ක්‍රියාශීලී ලෙස ජීවත් වීමට සහ තමන්ගේ එදිනෙදා ජීවිතය සහ තම සමාජය කෙරෙහි අඛණ්ඩව බලපෑම් කිරීමට හැකි වනු ඇත.

මේ ආකාරයෙන් සතුටුදායක හා ගුණාත්මක ජීවිතයක් සහතික කරලීම උදෙසා, ආබාධ සහිත වියපත් පුද්ගලයන් වෙනුවෙන් පහත සඳහන් විශේෂිත උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ.

- ආබාධිත බව සහ ආබාධවීමේ තත්ත්වයන් පිළිබඳ රෝග විනිශ්චයන් සහ ප්‍රතිකාර සඳහා සහ, චිත්ත වික්ෂේපයෙන් පසුවන්නන් සඳහා ඇතුලුව පසු සැලකිල්ල සඳහා, ප්‍රමාණවත් සේවාවන්ට ප්‍රවේශ පහසුකම් දියුණු කරනු ඇත.

- ඔවුන්ගේ ආබාධිත බව සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය, ප්‍රජා මූලික සේවාවන් මාර්ගයෙන් පුද්ගලයන්ට හා පවුල්වලට සැපයෙනු ඇත.

- ආගමික, සංස්කෘතික, සංවර්ධන සහ තමන් කැමති වෙනත් ක්‍රියාකාරකම්වල සහභාගිවීම මගින් සමාජ අන්තර්කරණය දිරිමත් කරනු ලබන අතර, ඒ සඳහා ප්‍රජා මූලික සහ වෙනත් සේවාවන් මගින් පහසුකම් සලසනු ලැබේ.

- සිය නිවෙස්වල ප්‍රවේශ පහසුකම් දියුණු කිරීම පිණිස, ආබාධ සහිත තැනැත්තන්ට ලබා ගත හැකි ණය මුදල්, ප්‍රදාන සහ වෙනත් ආකාරයේ සහය සාධාරණත්ව පදනමක් මත ආබාධ සහිත වියපත් පුද්ගලයන්ට ලබා ගත හැකි වනු ඇත.

- ආබාධ සහිත වෙනත් පුද්ගලයන්ට කරනු ලබන සුහසාධන ගෙවීම්, සාධාරණත්ව පදනමක් මත ආබාධ සහිත වියපත් පුද්ගලයන්ට ද ලබා ගත හැකි වනු ඇත.

- තෝරා ගැනීමේ නිදහස සහ අයුතු පරිහරණයෙන් නිදහස්වීම ආරක්ෂා කරනු ලැබේ. නේවාසික රැකවරණයෙහි නියුතු පුද්ගලයන් සම්බන්ධයෙන් මෙය අවධාරණය කරනු ලැබේ.

## 19 යුධ ගැටුම්වල බලපෑමට ලක් වූ පුද්ගලයන්

දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ පැවති ජනවාර්ගික ගැටුම, රටේ සියලු කොටස්වල ජනගහනයෙන් අති විශාල සංඛ්‍යාවකට හා අනාගත පරම්පරාවන්ට ආබාධ ඇති කරන ප්‍රතිඵල ගෙන දී ඇති අතර ඉදිරියට ද ප්‍රතිඵල ගෙන දෙනු ඇත.

(1) මෙම ආබාධ ඇති කරන ප්‍රතිඵලවලින් ඉතා විශාල ලෙස පැතිරී ඇති ප්‍රතිඵලයක් වී ඇත්තේ සහ වන්නේ, මානසික ප්‍රශ්න සහ පීඩාවන් ය. මානසික උපකාර ලබා දීම සඳහා ජාතික හැකියාව වැඩි කරනු ලැබේ. මානසික රෝග හඳුනා ගැනීම, මානසික සහය සහ විශේෂිත මානසික සහ මනෝ චිකිත්සක සැලකිල්ල සඳහා යොමු කිරීම ඇතුලුව නිවාස මට්ටමින් සහ ප්‍රජා මට්ටමින් ආරම්භ කරනු ලබන ස්ථර තුනකින් සමන්විත මනෝචිකිත්සක සමාජ උපකාර ක්‍රමයක් වර්ධනය කිරීම සඳහා, පවත්නා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන අංශ භාවිතා කරනු ලබන අතර ඒවායේ හැකියාවන් වැඩි කරනු ඇත.

(2) බිම් බෝම්බවල සහ වෙනත් පුපුරණ ද්‍රව්‍යවල විනාශකාරී ප්‍රතිඵල හේතුකොටගෙන, ඒවායින් ජීවිත බේරා ගත් පුද්ගලයන්, පෙනීම, ශ්‍රවණය, කථනය හා චලනය කෙරෙහි බලපාන විවිධ ආකාරයේ ආබාධිත භාවයන්ට හා චිත්තවේගාත්මක හා මානසික හානියට හා කම්පනයට ලක් වී ඇත. මෙය හේතුකොටගෙන, අතික් අතට ඔවුන්ට ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන්ගේ ප්‍රජාවට පසුව දරන්නට වී ඇති ආර්ථික සහ සමාජ පිරිවැය අධික වේ. මේවායින් ආබාධිත බවට පත් පුද්ගලයන්ට අවශ්‍ය සවිස්තරාත්මක උපකාර වන්නේ, හදිසි සහ අඛණ්ඩ වෛද්‍ය සැලකිල්ල, භෞතික පුනරුත්ථාපනය, මානසික සහ සමාජ උපකාර, රැකියා සහ සමාජ ආර්ථික යථා තත්ත්වයට පැමිණවීමේ වැඩසටහන් ය. බොහෝ දෙනෙකුට කෘත්‍රිම අවයම සැපයීම අත්‍යවශ්‍ය වේ. මෙම සියලු ප්‍රතිඵල සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා උපාය මාර්ග මෙම ප්‍රතිපත්තියෙහි විවිධ ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සහ අංශ අතර ව්‍යාප්තව අඩංගු වේ. කෙසේ වුව ද අදාල උපාය මාර්ග සාකල්‍ය පෙළ යෙදුමක් තුළ ඔහුගේ/ඇයගේ විශේෂිත අවශ්‍යතා පදනම් කරගෙන එක් එක් පුද්ගලයාට අදාල කළ යුතු වේ.

ගැටුමට සම්බන්ධ විනාශයන්හි ප්‍රතිඵලයක් වශයෙන්, අවතැන් වීමෙන් දුෂ්කරතාවට පත් ආබාධ සහිත වෙනත් දිවි බේරාගත් පුද්ගලයන් සම්බන්ධයෙන් යළි පදිංචි කිරීම ප්‍රමුඛතාවක් වේ. මෙය, මෙම ප්‍රතිපත්තියේ විෂය පථයෙන් බාහිර කරුණක් වේ.

(3) අනෙක් වැදගත් කරුණක් වන්නේ ගැටුමේ දෙපාර්ශවයේ ම ආබාධිත බවට පත් වූ හිටපු සටන්කරුවන්ගේ තත්ත්වයයි. මේ දක්වා බිම් බෝම්බවලින් පීඩාවට පත් විශාලම සංඛ්‍යාව ඔව්හු නියෝජනය කරති. සිය පවුල් සමග විශාල සංඛ්‍යාවකින් හා වැඩිම ප්‍රමාණයකින් මානසික ගැටලුවලින් පීඩා විඳින්නේ ඔවුන් ය. ඉහත දක්වා ඇති උපාය මාර්ග හැර හමුදා ජීවිතයෙන් සිවිල් ජීවිතය කරා මාරුවීම සහ තමන්ගේ ප්‍රජාව තුළ හා

ශ්‍රී ලංකා සමාජය තුළ සමාජීය හා ආර්ථික වශයෙන් යළි ස්ථාපනය වීම සඳහා ඔවුනට පහසුකම් සැලසීම පිණිස විශේෂ පියවර ගනු ලැබේ. ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා, විශේෂයෙන්ම රැකියා, වෘත්තීය පුහුණුව, සමාජ යළි අන්තර්කරණය සහ මානසික සහය යන ක්ෂේත්‍රයන්හි අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස පවත්නා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රමය ශක්තිමත් කරනු ලැබේ. ඔවුන්ගේ හැකියාව ශක්තිමත් කරන අතර ඔවුනට ජාතිය යළි ගොඩනැගීම සහ සහයෝගිතාව පිළිබඳ වැඩසටහන්වල සහ තමන් කැමති සංවර්ධන වැඩසටහන්වල සහභාගි වීමට ඉඩප්‍රස්ථා ලැබෙනු ඇත.

## 20 බරපතල ආබාධ සහිත තැනැත්තන්

බරපතල ආබාධ සහිත ළමුන්ගේ සහ වැඩිහිටියන්ගේ විශේෂ අවශ්‍යතා, ආබාධිතබව පිළිබඳ සහ සංවර්ධන වැඩසටහන්වල දී සැලකිල්ලට ගනු ලැබේ. දරුණු මනෝ චිකිත්සක ආබාධිතබව, බරපතල මානසික මන්දගාමීබව සහ බහුවිධ ආබාධ සහිත අය පිළිබඳව විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ.

- ප්‍රධාන ධාරාවේ අධ්‍යාපනයෙහි සහ විශේෂ පාසල්වල සහභාගි වීමට නොහැකි තරම් ආබාධිත ළමුන්, විශේෂඥ ගුරුවරුන්ගේ (peripatetic teachers) අධීක්ෂණය යටතේ ප්‍රජා මූලික වැඩසටහන් මගින් නිවසේ හෝ ප්‍රජා මධ්‍යස්ථානයක අධ්‍යාපනය ලබනු ඇත

- සිය ආබාධිත බව නිසා සිය නිවාස පරිසරයෙන් බැහැරට ගමන් කිරීමට නොහැකි තරුණ පුද්ගලයන්ට සහ වැඩිහිටියන්ට, ප්‍රජා මූලික වැඩසටහන් මාර්ගයෙන් ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම්වලට ප්‍රවේශ පහසුකම් ලැබෙනු ඇත.

- පුද්ගලයකුගේ ආබාධිතබව බරපතල වීම නිසා ඔහුට/ඇයට කිසිම අයුරකින් රැකියාවක හෝ ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකමක නිරතවීමට නොහැකි වන නමුත් පවුලේ ආර්ථික තත්ත්වය එසේ රැකියාවක යෙදීම අවශ්‍ය කෙරෙන අවස්ථාවක දී, පවුලට ප්‍රමාණවත් ආදායමක් ලැබෙන බව සහතික කරලීම සඳහා, පවුලේ එක් සාමාජිකයෙකු හෝ එයට වැඩි ගණනක් රැකියා හෝ ආදායම් ඉපයීමේ වැඩසටහන්වල ඇතුළත් කරනු ලැබේ.

- බරපතල ආබාධිතබව සහිත ළමුන් සහ වැඩිහිටියන් සහ ඔවුන්ගේ පවුල්වලට, ප්‍රජා මූලික වැඩසටහන් මගින් නිවස තුළ දී තාක්ෂණික සහය, උපදේශනය සහ උපකාර ලැබෙනු ඇත.

- තෝරා ගැනීමේ නිදහස සහ අයුතු පරිහරණයෙන් නිදහස්වීම සඳහා අයිතිය ආරක්ෂා කරනු ලැබේ. නේවාසික රැකවරණයෙහි නියුතු පුද්ගලයන් සම්බන්ධයෙන් මෙය අවධාරණය කරනු ලැබේ.

- දෙමාපියන්ගේ මරණින් පසු බරපතල ආබාධිතබව සහිත පුද්ගලයන්ගේ අඛණ්ඩ රැකවරණය ඔවුනට විශේෂයෙන් වැදගත් වන ක්ෂේත්‍රයකි. ප්‍රජා කණ්ඩායම් නිවාස ආදිය වැනි නව සහ නිරසාර ක්‍රියාමාර්ග උත්සාහකොට පරීක්ෂණයට ලක්කොට භාවිත කරනු ලැබේ. දෙමාපිය සංවිධාන, කණ්ඩායම් සහ ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන විසින් මේ සඳහා ආරම්භක පියවර ගනු ලබන අතර, ඒ

සඳහා වෙනත් රාජ්‍ය නොවන සංවිධාන සහ වගකිව යුතු රාජ්‍ය අංශවල සහය ලැබෙනු ඇත.

- ස්වේච්ජතාව, අවධානය ඌණ සහලක්ෂණය, වචන අන්ධතාව, සහ බරපතල මානසික මන්දගාමිබව වැනි ළමුන්ගේ නිතර හමුනොවන රෝගී තත්ත්වයන් සම්බන්ධයෙන් වෙනත් රටවල කරන ලද පර්යේෂණ හේතුකොටගෙන තාක්ෂණයේ විශාල දියුණුවක් ලබා ඇත. විකල්ප සහ වර්ධනය වන සන්නිවේදන ක්‍රම වැනි තාක්ෂණ ශිල්පක්‍රමවලට, මෙම රෝගී තත්ත්වයන්ගේ ආබාධ ඇති කරන බලපෑම අඩු කිරීමට හැකියාව ඇති අතර, එවැනි රෝගී තත්ත්වයන්ගේ බලපෑමට ලක් වූවන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කළ හැකිය. මෙය ඉදිරියේ සොයා ගත හැකි හා රෝග විනිශ්චයන්ට ලක් කළ හැකි ආබාධ ඇති කරන තත්ත්වයන්ට ද අදාල වේ.

  ආබාධිතබව සහ ආබධ ඇති කරන තත්ත්වයන් සම්බන්ධ තාක්ෂණයේ අන්තර් ජාතික වර්ධනයන් සමග ගමන් කිරීමට මේ අංශයේ කටයුතු කරන රාජ්‍ය අංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පියවර ගනු ලබන අතර, එම වර්ධනයන්ගෙන් ප්‍රයෝජනය ලැබිය හැකි ශ්‍රී ලංකාවේ ළමුන් හා වැඩිහිටියන් සඳහා එය යෝග්‍ය ලෙස සකස් කර ගනු ඇත.

## 21 <u>ජනමාධ්‍ය</u>

සිවිල් සමාජය දැනුවත් කිරීම, මෙහෙයවීම හා ක්‍රියාශීලී බවට පත් කිරීම සඳහා සහ ආබාධ සහිත තැනැත්තන්ගේ සමාජ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම සඳහා, ජනමාධ්‍ය විසින් ආබාධිත බව පිළිබඳ තොරතුරු බෙදා හරිනු ඇත. ආකල්පමය, චිත්තවේගාත්මක සහ භෞතික බාධක අඩු කරනු ලබන අතර, ආබාධ සහිත තැනැත්තන් සමාජයේ සිවිල්, සාමාජීය, දේශපාලනික සහ සංස්කෘතික ජීවිතයෙහි සහභාගිවීම වැඩි කරනු ඇත.

මේ සඳහා,

- සියලු ආකාරයේ ජනමාධ්‍ය, එනම් රජයේ සහ පෞද්ගලික මුද්‍රිත, රූපවාහිනී සහ ගුවන් විදුලිය සහභාගි වනු ඇත.

- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව සිවිල් සමාජයේ දැනුම ජනමාධ්‍ය විසින් වැඩි කරනු ඇත.

- ආබාධිතබව සම්බන්ධයෙන්, විශේෂයෙන් ආබාධ සහිත කාන්තාවන් පිළිබඳ ආකෘතිගත කිරීම් සහ නිශේධාත්මක සමාජ, සංස්කෘතික සහ චාරිත්‍රානුකූල විශ්වාස හා භාවිතාවන් අඩු කිරීමට ජනමාධ්‍ය විසින් පියවර ගනු ලැබේ.

- මෙම ප්‍රතිපත්තිය හා එහි බලපෑම් පිළිබඳව සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර පිළිබඳව, ජනමාධ්‍ය විසින් සිවිල් සමාජය දැනුවත් කිරීම සඳහා කටයුතු කරනු ඇත.

## VII සාකල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් සහතික කිරීම පිණිස ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

### 22 ප්‍රජා මූලික පුනරුත්ථාපනය

සමාජ සංවිධානයේ සහ සිවිල් පරිපාලනයේ සියලු මට්ටම්වල දී සිවිල් සමාජයෙහි සහ සංවර්ධන හා සුභසාධන වැඩටහන්වල ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් කිරීම මගින්, ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම් ප්‍රජා මූලික පුනරුත්ථාපනය විසින් ප්‍රවර්ධනය කරනු ලැබේ. ඔවුන් සිය ප්‍රජාවගෙන් වෙන්කොට තබන හා හුදෙකලා කරනු ලබන උපාය මාර්ග අධෛර්යමත් කරනු ලැබේ.

ප්‍රජා මූලික පුනරුත්ථාපනය, තිරස් හා සිරස් ජාල සහිත උඩුයටිකුරු එළඹුමක් වශයෙන් අඛණ්ඩව දියුණු කරනු ලැබේ. ආබාධ සහිත තැනැත්තන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන් ජීවත් වන ප්‍රජාව වෙත මූලික තීරණ ගැනීම පැවරේ. ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය හවුලේ ක්‍රියා කරන අතර, තාක්ෂණ සහය, යොමු කිරීමේ සේවාවන් සහ සංවිධාන කටයුතු ඇතුලු ප්‍රජා උපකාර ක්‍රම සපයනු ලැබේ.

ප්‍රජා මූලික පුනරුත්ථාපනය විසින් අවධානය යොමු කරන විශේෂිත උපාය මාර්ගවලට පහත සඳහන් ඒවා ඇතුළත් වේ.

- පවුල් ජීවිතය සඳහා අයිතිය ප්‍රවර්ධනය කිරීම පිණිස සහ වෙනත් අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කිරීම පිණිස ඔවුන්ගේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා නිවස තුළ සපයනු ලබන පෞද්ගලික සහ පවුල් උපකාරය.

- ආබාධ සහිත තැනැත්තන්ට ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවට දැනුම, නිපුණතා, උපදෙස්, උපදේශන සහ තොරතුරු ලබා දෙන අතර, එමගින් ආබාධ සහිත තම සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ උපරිම පෞද්ගලික සංවර්ධනය සහ ස්වාධීනව ජීවත්වීමට පහසුකම් සැලසීමට ඔවුනට හැකි වනු ඇත.

- සංවර්ධනය, විනෝද කටයුතු, විවේකය සහ සංස්කෘතික කටයුතුවල සහභාගිත්වය ඇතුලු දෛනික පවුල් සහ ප්‍රජා පරිසරය තුළ සමාජ අන්තර්කරණය.

- තම පෞරුෂය සහ හැකියාව උපරිමයට දියුණු කර ගැනීමට එක් එක් පුද්ගලයාට ඉඩප්‍රස්ථා සලසනු ලැබේ. සින්දු, නැටුම් සහ නිර්මාණාත්මක රචනය වැනි නිර්මාණාත්මක සහ ප්‍රසාංගික කලාවන්හි දක්ෂතාවන් සහ මූලික ඉන්ද්‍රිය චාලක නිපුණතාවල සිට ශාරීරික ක්‍රියාකාරකම් හා ක්‍රීඩා නිපුණතා දක්වා පරාසයක දිවෙන නිපුණතා දියුණු කිරීම මෙයට ඇතුළත් වේ. ප්‍රජා කණ්ඩායම්වල සහභාගිවීම සහ ප්‍රජා සංවිධානවල නායකත්වය ගැනීම මගින් තම පෞරුෂය දියුණු කර ගැනීමට එක් එක් පුද්ගලයාට ලැබෙන ඉඩප්‍රස්ථා ද මෙයට ඇතුළත් වේ.

- සම කණ්ඩායම්, ස්වංය බලපෑම් කිරීමේ සංවිධාන සහ දෙමාපිය සංගම් පිහිටුවීම

- පොදු සේවා සඳහා සැම පුද්ගලයෙකුටම ඇති අයිතිය ප්‍රකාර ව, තිවසේ ජීවත් වන තැනැත්තා සහ සමාජ සංවර්ධන සහ ප්‍රජා උපකාරක ක්‍රම අතර, විශේෂයෙන් මෙම ප්‍රතිපත්තියෙහි ඇතුලත් කර ඇති රැකියා නිපුණතා පුහුණුව දිළිඳුකම දුරලීම සෞඛ්‍ය සමාජ ආරක්ෂණය වැනි) ක්‍රම අතර, යොමු කිරීම් සඳහා වර්ධනය කරනු ලබන ඉහළ සිට පහලට හා පහළ සිට ඉහලට යොමු වූ දෙයාකාරයේ මාර්ග.

- මෙම උපාය මාර්ග අවශ්‍ය වන කුමන හෝ ආබාධිත තත්ත්වයක, වයසක සිටින ස්ත්‍රී පුරුෂ කවර හෝ පුද්ගලයන් කරා ළගා වීම.

## 23 රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය.

- රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය විසින් ආබාධිතබව සම්බන්ධ රාජ්‍ය අංශයේ ප්‍රයත්නයන් සංයෝග කිරීම සහ ඒවාට ආධාර කිරීම කරනු ලැබේ.

- ආබධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව, සාධාරණත්වයේ පදනම මත ඔවුන් විසින් ආබාධ සහිත තැනැත්තන් අදාල සියලූ ව්‍යාපෘති සහ වැඩසටහන්වල ඇතුලත් කරනු ලැබේ.

## 24 පර්යේෂණ

(1) ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය, වගකිව යුතු රාජ්‍ය අංශ සහ විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන විසින්, ආබාධිතබව පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කරනු ලැබේ. එවැනි ආබාධිත බව පිළිබඳ පර්යේෂණ අධ්‍යයන වටිනාකමකින් පමණක් යුක්ත ඒවා නොවන අතර, ක්‍රියාවන් අරමුණු කරගත් හා සමාජ යුක්තිය උදෙසා කරන පර්යේෂණ වේ.

(2) දැනට කෙරිගෙන යන හෝ වාර වශයෙන් කරන පර්යේෂණ ක්‍රියාකාරකමක් වශයෙන්, ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය විසින්, ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මහලේකම් කාර්යාලය මාර්ගයෙන් හෝ වෙනත් ආයතන මාර්ගයෙන් මගින් ආබාධිත බව පිළිබඳ ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම පහසු කරවන්නා වූ තොරතුරු එකතු කිරීම, සැසදීම, විග්‍රහ කිරීම සහ බෙදා හැරීම කරනු ලැබේ. ආබාධ සහිත තැනැත්තන්ගේ වෙනස් වන අවශ්‍යතා, ඔවුන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය, ආබාධිත බව පිළිබඳ අයිතිවාසිකම් හා වගකීම්, අන්තර්කරණයට බාධක පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත සහ තොරතුරු මෙයට ඇතුලත් වේ.

## 25 ව්‍යවස්ථා සම්පාදනය

ආබාධ සහිත තැනැත්තන්ට සමාජ, සිවිල්, ආර්ථික සහ නෛතික ආරක්ෂාව සැපයීම සඳහා ව්‍යවස්ථා සංශෝධනය කිරීම/පැණවීම සිදු කරනු ලැබේ.

මේ සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය විසින්,

- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම්[23] ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පවත්නා ව්‍යවස්ථා සමාලෝචනය කිරීම පිණිස සහ මෙම ප්‍රතිපත්තිය ප්‍රකාරව ව්‍යවස්ථාවලට අවශ්‍ය වන යම් වෙනස්කම් ඇතොත් ඒවා සිදු කිරීම පිණිස, ක්ෂේත්‍රයේ විශේෂඥයන් කණ්ඩායමක් පත් කළ යුතුය. දැනට පවත්නා නීති වෙනුවට නව ව්‍යවස්ථා පැණවීම සුදුසු වන්නේ නම්, එසේ පවත්නා ව්‍යවස්ථා වෙනුවට නව ව්‍යවස්ථා පණවනු ලැබේ.

- ආබාධ සහිත තැනැත්තන් වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය කරවන්නා වූ කිසියම් වගන්ති තිබේ දැයි තීරණය කිරීම සඳහා සහ, එවැනි වගන්ති අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා වෙනත් පවත්නා ව්‍යවස්ථා සමාලෝචනය කිරීම පිණිස විශේෂඥයන්ගේ කණ්ඩායමක් පත් කළ යුතුය.

- අනාගත සියලු ව්‍යවස්ථාවල ආබාධ සහිත තැනැත්තන්ට නෛතික සාධාරණත්වය සහතික කළ යුතුය.

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලබන සංශෝධන ඇතුලු අනාගත ව්‍යවස්ථාවල යෝග්‍ය අවස්ථාවන් හි දී, වෙනස්කමකට භාජනය කිරීමට එරෙහි වගන්ති ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.

- තමන්ගේ නෛතික අයිතිවාසිකම් සහ, මෙම අයිතිවාසිකම් උල්ලංඝණය කරනු ලැබූ විට ගත හැකි පියවර පිළිබඳව, ආබාධ සහිත තැනැත්තන්ට දැනුම් දීමට පියවර ගැනීම.

## 26 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ ඇගැයීම

(1) ඉහත දක්වන ලද ප්‍රතිපත්ති, ක්ෂේත්‍ර හෝ උපාය මාර්ග කිසිවක් යම් අමාත්‍යාංශයක් වෙත පවරා ඇති විෂයයන්ට සහ කාර්යයන්ට ඇතුළත් වේ නම්, හෝ දක්වා ඇති උපාය මාර්ග එයට අයත් ආයතනයක ක්‍රියාත්මක කර තිබේ නම්, එම එක් එක් අමාත්‍යාංශය විසින් මෙම ප්‍රතිපත්ති අංග සිය ප්‍රතිපත්තිවල සහ උපාය මාර්ග (අයවැය ලේඛනය සහ නියාමනය කිරීමේ හා ඇගැයීමේ ක්‍රියාවලි ඇතුලුව) සිය ක්‍රියාකාරී සැලසුම්වල ඇතුළත් කිරීමේ වගකීම දරනු ඇත.

(2) ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය විසින් මෙම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම හා ඇගැයීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ.

මේ සඳහා,

- වෙනත් අමාත්‍යාංශ සමග අංශ සහ හරස් අංශ උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම මගින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරිය යුතුය.

---

23 Parliament of Sri Lanka. *Protection of the Rights of Persons with Disabilities Act No. 28 of 1996*.

- අඛණ්ඩ සහභාගිත්ව නියාමනය කිරීමේ ක්‍රමයක් පිහිටුවීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී එයට වෙනස්කම් හඳුන්වා දීම සඳහා මෙම ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ අදහස් විමසීම.

- නියාමන ක්‍රමය මගින් නිර්දේශ කළ හැකි වැඩසටහන් සම්පාදනය පිළිබඳව සම්බන්ධ සියලු අංශවල අදහස් විමසීම.

- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව පවත්නා තත්ත්වය තීරණය කිරීම සඳහා (අවම වශයෙන් වසර **5** කට වරක්) වාරික සහභාගිත්ව ඇගැයීම් සිදු කරවීම.

- මෙම ප්‍රතිපත්තිය පිළිබඳව සහ නියාමනය කිරීමේ සහ ඇගැයීමේ ප්‍රතිඵල ඇතුලුව එය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර පිළිබඳව ආබාධ සහිත තැනැත්තන්ට සහ පොදු මහජනතාවට දැනුම් දීම.

## VII <u>ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවෝ</u>

ආබාධිතබව පිළිබඳ මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හවුල්කරුවන් කිහිපදෙනෙක් වගකීම බෙදා ගනිති. ඔවුනට පහත සඳහන් ආයතන ඇතුළත් වේ.

- ❖ රජය, විශේෂිත අමාත්‍යාංශ සහ විමධ්‍යගත පරිපාලනය මාර්ගයෙන්
- ❖ ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය
- ❖ ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන සහ දෙමාපිය කණ්ඩායම්
- ❖ සිවිල් සමාජය සහ විශේෂයෙන් ප්‍රජාවන්, ප්‍රජා මූලික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශ, වෘත්තීයවේදී කණ්ඩායම්, සිවිල් කණ්ඩායම්, ආගමික කණ්ඩායම්, දේශපාලන සංවිධාන සහ මාධ්‍ය.

### ❖ රජය

වත්මන් කාලයේ සමහර ප්‍රතිපත්ති ක්ෂේත්‍ර, එක් විශේෂිත අමාත්‍යාංශයකට පවරන ලද විෂයය සහ කාර්යයන් තුළට අයත් වීම හෝ ලැයිස්තුගත කර ඇති උපාය මාර්ග එයට පවරා ඇති ආයතනයක ක්‍රියාත්මක කිරීම සිදු වේ. අමාත්‍යාංශ කිහිපයකට පවරා ඇති විෂයයන් හෝ කාර්යයන් යටතට අනෙක් ක්ෂේත්‍ර ඇතුළත් විය හැකිය. මෙලෙස පැවරී ඇති විෂයයන් සහ කාර්යයන් හා ආයතන කලින් කල වෙනස් විය හැකිය.

මේ හේතු නිසා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග දැක්වීමේ දී දෙවන කොටසෙහි විශේෂිත අමාත්‍යාංශ සඳහන් කර නොමැත.

ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හෝ උපාය මාර්ග එකක් හෝ එකකට වැඩි ගණනක්, සිය විෂයයන් සහ කාර්යයන් හෝ එයට පවරා ඇති ආයතන තුළට ඇතුළත් වී ඇති කිසියම් අමාත්‍යාංශයක්, එම ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සහ උපාය මාර්ග සම්බන්ධයෙන් වගකීම දැරිය යුතුය.

පහත සඳහන් ලැයිස්තුව නිදසුනක් වශයෙන් දැක්විය හැකිය. මෙම ලැයිස්තුව පරිපූර්ණ නොවන බව සටහන් කර ගත යුතුය.

**2003 ජනවාරි වන විට විශේෂිත අංශ පිළිබඳ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ (එයට පවරා ඇති ආයතන ද ඇතුලුව)**

| | ප්‍රතිපත්ති ක්ෂේත්‍රය | ලැයිස්තු ගත කරන ලද පරිදි සංඛ්‍යාව |
|---|---|---|
| රැකිරක්ෂා සහ කම්කරු අමාත්‍යාංශය | රැකිරක්ෂා | 1 |
| තෘතියික අධ්‍යාපන සහ පුහුණු අමාත්‍යංශය | වෘත්තිය පුහුණු<br>උසස් අධ්‍යාපන | 2<br>6 |
| කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය | නිපුණතා සංවර්ධනය<br>ස්වයං රැකියා | 2<br>1 |
| ව්‍යවසායකත්ව සංවර්ධන, කාර්මික ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යංශය | නිපුණතා සංවර්ධනය<br>ස්වයං රැකියා | 2<br>1 |
| ධීවර සහ සාගර සම්පත් අමාත්‍යංශය | නිපුණතා සංවර්ධනය<br>ස්වයං රැකියා | 2<br>1 |
| වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය | රැකීරක්ෂා<br>නිපුණතා සංවර්ධනය | 1<br>2 |
| සමෘද්ධි අමාත්‍යාංශය | දිළිඳුබව දුරලීම<br>නිපුණතා සංවර්ධනය<br>ස්වයං රැකියා | 3<br>2<br>1 |
| මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | පාසල් අධ්‍යාපනය<br>නොවිධිමත් අධ්‍යාපනය | 4<br>5 |
| සෞඛ්‍ය, පෝෂණ සහ සුහසාධන අමාත්‍යාංශය | සෞඛ්‍ය<br>ළමුන්<br>වියපත් පුද්ගලයන්<br>යුධ ගැටුම්වල බලපෑමට ලක් වූ පුද්ගලයන් | 7<br>15<br>18<br>19 |
| තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා<br>තරුණ | 8<br>16 |
| ප්‍රවාහන, මහාමාර්ග සහ ගුවන් අමාත්‍යාංශය | ප්‍රවාහන | 9<br>12 |
| නිවාස සංවර්ධන අමාත්‍යාංශය | නිවාස | 10<br>12 |
| සංචාරක අමාත්‍යාංශය | ප්‍රවේශ පහසුකම් සහිතසංචාරක ව්‍යාපාරය | 12 |
| ආර්ථික ප්‍රතිසංස්කරණ, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය | තොරතුරු තාක්ෂණ | 13 |
| වනිතා කටයුතු අමාත්‍යාංශය | කාන්තාවන් | 17 |
| පුනරුත්ථාපන, යළි පදිංචි කිරීමේ සහ සරණාගතයන් පිළිබඳ අමාත්‍යාංශය | යුධ ගැටුම්වල බලපෑමට ලක් වූ පුද්ගලයන් | 19 |
| ජන සන්නිවේදන අමාත්‍යාංශය | ජන මාධ්‍ය | 21 |

| | | |
|---|---|---|
| සමාජ සුභසාධන අමාත්‍යාංශය | වෘත්තිය පුහුණු<br>සමාජ ආරක්ෂණ<br>ගොඩනැගූ පරිසරයට ප්‍රවේශය<br>සන්නිවේදනයට සහ තොරතුරුවලට ප්‍රවේශය<br>ආධාරක උපකරණ සහ තොරතුරු තාක්ෂණය<br>ළමුන්<br>වියපත් තැනැත්තන්<br>යුධ ගැටුම්වල බලපෑමට ලක් වූ පුද්ගලයන්<br>බරපතල ආබාධ සහිත තැනැත්තන්<br>ප්‍රජා මූලික පුනරුත්ථාපනය<br>රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය<br>පර්යේෂණ<br>ව්‍යවස්ථා සම්පාදනය | 2<br>11<br>12<br>13<br>14<br>15<br>18<br>19<br>20<br>22<br>23<br>24<br>25 |
| *වෙනත් ආයතන:*<br><br>රණවිරු සේවා අධිකාරිය | යුධ ගැටුම්වල බලපෑමට ලක් වූ පුද්ගලයන් | 19 |

*විශේෂිත ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වගකීම් දරන්නා වූ ලැයිස්තුගත කර ඇති අමාත්‍යාංශ හැර, පහත සඳහන් අමාත්‍යාංශවලට ද මෙම ප්‍රතිපත්තියට අදාලව ඉටු කළ යුතු කාර්ය භාරයක් ඇත*

| | ප්‍රතිපත්ති ක්ෂේත්‍රය | ලැයිස්තු ගත කරන ලද පරිදි සංඛ්‍යාව |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ ඇගැයීම | 26 |
| රාජ්‍ය පරිපාලන කළමණාකරණ සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | | |
| ස්වදේශීය කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | | |
| බස්නාහිර ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | | |
| නැගෙනහිර සංවර්ධන සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | | |
| මධ්‍යම ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | | |
| වයඹ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | | |
| දකුණු ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | | |

### ❖ ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය

විශාල පරිමාණවල පැතිකඩක් පිළිබඳ කරුණක් මෙන්, මෙම ප්‍රතිපත්තියෙහි සලකා බැලෙන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා විශේෂිත අමාත්‍යාංශ මගින් රජයේ විවිධ අංශ අතර වගකීම බෙදා ගැනීම අවශ්‍ය කෙරේ. එහෙයින් මෙම ප්‍රතිපත්තිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා එල්ලයක් කරා යොමු වූ සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන කොටස්කරුවන්ගේ නියෝජනය ඇති ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය විසින් නියාමනය කිරීම සහ ඇගැයීම ඇතුලු මෙම සම්බන්ධීකරණය කිරීමේ කාර්යය ඉටු කරනු ලබයි

### ❖ ආබාධ සහිත තැනැත්තන්, ඔවුන්ගේ සංවිධාන සහ දෙමාපිය කණ්ඩායම්

මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ සියලු අදියරවල දී, ආබාධ සහිත තැනැත්තන්, ඔවුන්ගේ සංවිධාන සහ දෙමාපිය කණ්ඩායම් නියෝජනය වී ඇත. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සියලු තීරණ ගැනීමේ ක්‍රියාවලින් හි දී, ඔවුන් සමාන දායකත්වයක් සැපයීම, ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතාවන්ට ප්‍රතිපත්තියේ සම්පූර්ණ බලපෑම සහ අඛණ්ඩ අදාල භාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නේය. ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය තුළ ඔවුන්ගේ තත්ත්වයට අතිරේකව, ආබාධිත බව සම්බන්ධ කරුණු පිළිබඳව කටයුතු කරන්නා වූ සියලු අංශ පිළිබඳ යාන්ත්‍රණයන්හි ඔවුන් නියෝජනය වනු ඇත.

### ❖ සිවිල් සමාජය

සාධාරණත්වය සහ ආබාධ සහිත තැනැත්තන් ප්‍රධාන ධාරාවේ අන්තර්කරණය සිදු කල හැක්කේ සිවිල් සමාජය විසින් ආබාධ සහිත තැනැත්තන්ගේ සමාන අයිතිවාසිකම් පිළිගන්නේ නම් සහ, එවැනි අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ වගකීම භාර ගන්නේ නම් පමණි.

ආබාධ සහිත තැනැත්තන් සිය දෛනික ජීවිත ගත කරන ප්‍රජාවගෙන් ආරම්භකොට, ප්‍රජා මූලික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය, වෘත්තියවේදීන්ගේ කණ්ඩායම්, සිවිල් කණ්ඩායම්, ආගමික කණ්ඩායම් සහ දේශපාලන කණ්ඩායම්වලට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කල යුතු වැදගත් කාර්ය භාරයක් ඇත. පළමුවෙන් ඔවුන් විසින් ම මෙම ප්‍රතිපත්තියේ ගැබ් වූ මූලධර්ම ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. දෙවනුව අන්‍යයන් ද එය සිදු කරන බව ඔවුන් විසින් සහතික කිරීම අවශ්‍ය වේ. මෙම ක්ෂේත්‍ර දෙකෙහි දී ම සිවිල් සමාජයට දැනුම් දීමේ සහ බලපෑම් කිරීමේ වැදගත් කාර්යය ජනමාධ්‍ය වෙත පැවරේ.

## උපග්‍රන්ථය

### කෙටුම්පත් කිරීමේ කමිටුවේ සාමාජිකයෝ

*ආචාර්ය පද්මිණි මෙන්ඩිස්*
*සභාපතිනිය*

ආචාර්ය මෙන්ඩිස් මහත්මිය පසුගිය වසර 24 ක කාලයක් තිස්සේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ වෙනත් එක්සත් ජාතීන්ගේ සහ අන්තර්ජාතික නියෝජිත ආයතනවල ආබාධිතබව පිළිබඳ උපදේශකවරියක් වශයෙන් සේවය කර ඇත. ප්‍රජා මූලික පුනරුත්ථාපනය ගෝලීය වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඇය විසින් ඉටු කරන ලද පුරෝගාමී කාර්ය භාරය සහ සපයන ලද දායකත්වය පිළිගැනීමක් වශයෙන් 1990 දී ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලය විසින් ඇයට වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය (M.D.) පිරිනමන ලදී. කැලණිය විශ්ව විද්‍යාලයේ ආබාධිත බව පිළිබඳ අධ්‍යයන ඒකකය ස්ථාපනය කිරීමේ මූලිකත්වය ඇය විසින් ගනු ලැබූ අතර 1993 - 1998 දක්වා කාලය තුළ එහි පාඨමාලා අධ්‍යක්ෂකවරිය (අංශ ප්‍රධාන) වූවාය. ආචාර්ය මෙන්ඩිස් 1980 සිට ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආබාධිතබව සහ පුනරුත්ථාපනය පිළිබඳ විශේෂඥ උපදේශක මණ්ඩලයේ සාමාජිකාවක්ව සිටින්නිය. ඇය දැනට සමාජ සුභසාධන අමාත්‍යාංශයේ උපදේශිකාවක් වශයෙන් ද සේවය කරන්නිය.

*ලක්මාලි කබ්රාල් මිය*

කබ්රාල් මහත්මිය මෑතක් වනතුරු මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිඥයෝ නම් සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනිය සහ මහ ලේකම්වරිය වශයෙන් කටයුතු කළාය. පසුගිය වසර 15 තිස්සේ ඇය මානව හිමිකම් උපදේශනය සම්බන්ධයෙන් කටයුතු කළාය. මෙම ක්ෂේත්‍රය තුළ ඇගේ සේවයට වැඩසටහන් සැලසුම් කිරීම සහ කළමණාකරණය (නියාමනය සහ ඇගැයීම), නීති ආධාර සැපයීම, සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම, පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශන ගණනාවකට දායක වීම අයත් විය.

*ගිහාන් ගලේකොටුව මහතා*

ගලේකොටුව මහතා දැනට මහනුවර පිහිටි රාජ්‍ය නොවන සංවිධානයක් වන ප්‍රිඩ්සෝ (FRIDSRO) ආයතනයේ ආබාධිතබව සහ සංවර්ධනය පිළිබඳ අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කරයි. රජය සමග සම්බන්ධ වී මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජා මූලික වැඩසටහන් සංවර්ධනය කිරීමේ විශේෂ වගකීම ඔහු දරයි. මෙම කාර්ය භාරයේ දී පහළ මට්ටමේ ආබාධ සහිත පුද්ගලයින් සමග වැඩ කිරීම, ඔවුන් සමග අයිතිවාසිකම් පදනම් කරගත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ස්ව බලපෑම් කිරීම සහ බලගැන්වීම සඳහා ඔවුන්ගේ ප්‍රයත්නයන්ට සහය වීම පිළිබඳ විශාල අත්දැකීම් ඔහු විසින් ලබා ඇත. ඔහු ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලයේ සේවය කර ඇති අතර දැනට ජාතික ප්‍රජා මූලික

වැඩසටහන් මෙහෙයවීමේ ජාතික කමිටුවේ සාමාජිකයෙක් වෙයි. ඔහු මහනුවර දිස්ත්‍රික්කයේ ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධානයේ තාක්ෂණික උපදේශකවරයා සහ ප්‍රජා මූලික වැඩසටහන්වල ජාතික සම්පත් දායකයෙක් ද වෙයි.

*එස්. එල්. හෙට්ටිආරච්චි මහතා*

ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලයේ ආරම්භක සාමාජිකයන්ගෙන් කෙනෙකු වූ හෙට්ටිආරච්චි මහතා, දැනට එහි ගරු ලේකම්/විධායක අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කරයි. වයස අවුරුදු 7 දී අන්ධභාවයට පත් වූ ඔහු සිය දෘශ්‍යාබාධිත ක්ෂේත්‍රයේ සේවය ආරම්භ කළේ දැනට අවුරුදු 46 කට පෙර 1957 දී සමස්ත ලංකා අන්ධ ජන සංගමයේ ආරම්භක සාමාජිකයෙකු හා ප්‍රථම සම ලේකම් වීමත් සමගය. ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලයේ ඔහු සේවය කර ඇත. දැනට ඔහු සේවය කරමින් සිටින විවිධ කමිටු අතර, අන්ධ පුද්ගලයන්ගේ ජාතික ක්‍රිකට් සම්මේලනයේ අනුශාසක, අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යාපන උපදේශක කමිටුවේ සාමාජික, සහ දෘශ්‍යාබාධිත වූවන්ගේ භාර අරමුදලේ සාමාජික වශයෙන් ද කටයුතු කරයි.

*අනිල් ජයවර්ධන මහතා*

ජයවර්ධන මහතා ශ්‍රී ලංකා බිහිරි පුද්ගලයන්ගේ මධ්‍යම සම්මේලනයේ හිටපු සභාපතිවරයා සහ එහි වත්මන් උප සභාපතිවරයා වෙයි. ඔහු දැනට ශ්‍රී ලංකා බිහිරි පුද්ගලයන්ගේ මධ්‍යම සම්මේලනයේ වැඩිදියුණුව සඳහා සිය කාලය සහ ප්‍රයත්නය කැප කරමින් සිටී. උපතේ පටන් බිහිරි බව උරුම කර ගත් ඔහු, එම සංවිධානය ආරම්භ කළ 1985 වර්ෂයේ සිට එහි සාමාජිකයෙකු වෙයි. රත්මලානේ බිහිරි පාසලේ අධ්‍යාපනය ලැබූ කාලයේ සිට ඔහු අන්තර්ජාතික ක්‍රීඩා උසව්වලට සහභාගි වී පදක්කම් කිහිපයක් දිනා ඇත. ඒවා අතර රන් පදක්කම් 2 ක් ද වෙයි. ශ්‍රී ලංකාවේ බිහිරි පුද්ගලයන්ගේ ව්‍යාපාරයේ නායකයකු වශයෙන් බොහෝ අන්තර්ජාතික පුහුණු පාඨමාලාවලට සහභාගි වී සිය සංවිධානාත්මක නිපුණතා සහ හැකියවන් දියුණු කරගත් ජයවර්ධන මහතා එම හැකියාවන් බිහිරි පුද්ගලයන්ගේ මධ්‍යම සම්මේලනයේ දියුණුව සඳහා යොදවයි.

*එන්. ජී. කමලාවති මහත්මිය*

අනුරාධපුරයේ ආබාධ සහිත කාන්තාවන්ගේ සම්මේලනයේ සභාපතිවරිය වන කමලාවති මහත්මිය, එහි ආරම්භක සාමාජිකාවක වශයෙන් එයට සම්බන්ධ වී සිටින්නීය. වයස අවුරුදු 4 දී පෝලියෝ රෝගය වැළඳීම නිසා බරපතල ආබාධයට ලක් වූ ඇය, අන්තර්ජාතික ක්‍රීඩා උසව් කිහිපයක ආබාධ සහිත කාන්තාවන් නියෝජනය කරමින් පදක්කම් කිහිපයක් දිනා ගත්තාය. එසේම ඇය 1995 දී චීනයේ බෙයිජිං නගරයේ පැවති කාන්තාවන්ගේ ලෝක සම්මේලනයේ දී ආබාධ සහිත කාන්තාවන් නියෝජනය කළාය. ඇය ජපන් අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය (JICA) විසින් ජපානයේ සංවිධානය කරනු ලැබූ සහ එස්කැප් සංවිධානය (ESCAP) විසින් තායිලන්තයේ පවත්වනු ලැබූ නායකත්ව සහ ආබාධිත බව සම්බන්ධ පාඨමාලාවලට සහභාගි වී ඇත.

*එච්. පී. එන්. ලක්ෂ්මන් මහතා*

ලක්ෂ්මන් මහතා දැනට මානව සම්පත් සංවර්ධනය අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යාපනය පිළිබඳ වගකීම දරන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකු වෙයි. ඔහු ගොට්බෝර්ග් විශ්වවිද්‍යාලයෙන් විශේෂ අධ්‍යාපනය පිළිබඳ එම්. ඒ. උපාධියක් ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ද, සාමාන්‍ය අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය සහ අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ පශ්වාත් උපාධියක් ද ලබා ඇත. ඔහු අධ්‍යාපන අමාත්‍යංශයේ විශේෂ අධ්‍යාපන උපදේශක කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

මහාචාර්ය නාලක මෙන්ඩිස්

මහාචාර්ය මෙන්ඩිස් 1989 සිට කොළඹ විශ්ව විද්‍යාලයේ මනෝ චිකිත්සාව පිළිබඳ මහචාර්ය තනතුර සහ 1982 සිට ශ්‍රී ලංකාවේ ජාතික රෝහලේ විශ්වවිද්‍යාල මනෝ වෛද්‍ය විද්‍යා ඒකකයේ ජ්‍යෙෂ්ඨ මනොචිකිත්සක තනතුර ද දරා ඇත. ඔහු සේවය කර ඇති බොහෝ ව්‍යවස්ථාපිත සහ වෙනත් කමිටු සහ මණ්ඩල අතර සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය උපදේශක සභාව, අබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාව සහ අන්තර්ජාතික වෘත්තියවේදීන්ගේ සංගම් ද වෙයි. 1982 දී පිහිටුවන ලද එවකට ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය නොවන සංවිධානය වූ, මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික මණ්ඩලය පිහිටුවීමට මහාචාර්ය මෙන්ඩිස් මූලිකත්වයක් ගෙන කටයුතු කළේය.

*ඩබ්ලිව් එච්. ඩබ්ලිව් සොයිසා මහතා*

සොයිසා මහතා සමාජ සුහසාධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු හා අමාත්‍යාංශයේ ප්‍රජා මූලික පුනරුත්ථාපන ඒකකයේ ප්‍රධානියා වෙයි. ඔහු සමාජ සුහසාධන අමාත්‍යාංශයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ද වෙයි. ඔහු 1973 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුනේය. එතැන් පටන් ඔහු දැරූ තනතුරු අතර තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ජාතික සමාජ සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්, තැපැල්පති, පළාත් පාලන සහා කිහිපයක විශේෂ කොමසාරිස්, තරුණ කටයුතු අමාත්‍යාංශයේ කුඩා පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන අංශයේ අධ්‍යක්ෂක සහ ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ සහ ශ්‍රී ලංකා ටෙලිකොම්හි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික විය.

*සිරිල් සිරිවර්ධන මහතා*

**1980** දී පරාඝාතයට ලක් වූ සිරිවර්ධන මහතා එදා පටන් රෝද පුටු භාවිත කරන්නෙකු වෙයි. ඔහු ගුවන් ඉලෙක්ටොනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සුදුසුකම් ලද්දෙකි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බලඝණ නායක තනතුර දරමින් සිටිය දී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වසර **37** ක සේවයෙන් පසු විශ්‍රාම ලැබූ ඔහු, දැන් ආබාධිතබව පිළිබඳ ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන සේවයේ නිරත වෙයි. ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලයේ ඔහු සේවය කර ඇත. දැනට ඔහු දරන තනතුරු අතර මෝටිවේෂන් ශ්‍රී ලංකා

ආයතනයේ ව්‍යාපෘති නිලධාරී (බලපෑම් කිරීම්), ආබාධ සහිත තැනැත්තන්ගේ ඒකාබද්ධ පෙරමුණෙහි මහ ලේකම්, ශුසුම්නා ආබාධ සහිත වූවන්ගේ සංගමයේ උප සභාපති, ආබාධ සහිත තැනැත්තන්ගේ පුනරුත්ථාපනය සඳහා ශ්‍රී ලංකා පදනමෙහි ගරු ලේකම් සහ කොළඹ අසරණ සරණ සමිතියේ (ජායිපූර් පාද වැඩසටහන) ගරු ලේකම් වෙයි.

*ඊ. එම්. ජී. තිලකරත්න මහතා*

තිලකරත්න මහතා බුද්ධිමය ආබාධ සහිත ළමුන්ගේ, වැඩිහිටියන්ගේ, සහ පුද්ගලයන්ගේ, දෙමාපියන්ගේ, අයිතිවාසිකම් නියෝජනය කරන විශාලතම සහ පැරණිතම රාජ්‍ය නොවන සංවිධානය වූ, මන්ද බුද්ධිකයන් සඳහා වූ ලංකා සංගමයේ වත්මන් සභාපති වෙයි. විශ්‍රාම ලත් දේශීය ආදායම් කොමසාරිස්වරයකු වන ඔහු, රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු කිහිපයක් දරා ඇත. ඒවා අතර, ඔහු ලංකා හෝටල් හෝටල් සංස්ථාවේ සභාපති, රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ වන්දි මණ්ඩලයේ සාමාජිකයකු විය. ඔහු සිය රාජකාරි ඉටු කිරීමේ දී පුළුල් ලෙස සංචාරය කර ඇත.

*යමුණා චිත්‍රාංගනී මිය*
*කමිටුවේ ලේකම්*

යමුණා චිත්‍රාංගනී මහත්මිය වියපත් පුද්ගලයන් සඳහා ජාතික මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකවරිය වෙයි. 1981 දී රාජ්‍ය සේවයට බැඳුනු දා පටන් ඇය සමාජ සේවා ක්ෂේත්‍රයේ සේවය කර ඇත. ඇය විවිධ කමිටුවල දී සමාජ සේවා අමාත්‍යාංශය නියෝජනය කර ඇත. ඒවා අතර අධ්‍යාපන අමාත්‍යංශයේ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික කමිටුව, වියපත් වීම පිළිබඳ ජාතික කමිටුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් පිළිබඳ සංග්‍රහ සහ ප්‍රමිති පිළියෙළ කිරීමේ කමිටුව සහ සමාජ සුභසාධන අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍යය පිළිබඳ අනු කමිටුව වෙයි.

2003 මැයි මස 02